දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - 2019

-----------------------------------------------------------------------

දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 ජූලි 10 දින එළඹි මූල්‍ය ගිවිසුම් අංක 5417(එල්කේ) හි 2 වන උපලේඛනයේ II(ඇ) වගන්තිය හා 2010 ජූලි 31 දිනැති ණය ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

-----------------------------------------------------------------------------------------

දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව, එවකට කෘෂිකර්ම, පශුසම්පත් සංවර්ධන, වාරිමාර්ග හා ජලජීවී සම්පත් අමාත්‍යාංශය (වර්තමානයේ වාරිමාර්ග අමාත්‍යාංශය) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දේශගුණික අවධානම් ඇති විය හැකි ජනතාව හා වත්කම් අනතුරු වලට භාජනය වීම අඩුකිරීම සහ ආපදාවලට ඵලදායීව ප්‍රතිචාර දැක්වීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 14, 617 කට සමාන ඩොලර් මිලියන 111.8 ක් වන අතර ඉන් රු. මිලියන 14,382 කට සමාන ඩොලර් මිලියන 110 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යයනය කිරීමටට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු 05 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 වන විට වීම කිරීමට නියමිතය.

## 1.3 මතය

------

වැඩසටහනෙහි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික ප්‍රගතිය

### 2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ඇගයිම් ලියවිල්ල අනුව (අ) ද්‍රෝණි ආයෝජන සැලසුම් සංවර්ධනය, (ආ) දේශගුණික අවබලපෑම් අවම කිරීමේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම,(ඇ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහය ලබාදීම සහ (ඈ) හදිසි අසම්භව්‍යයන්ට ප්‍රතිචාර දැක්විම යන ප්‍රධාන සංරචක 4 කින් සමන්විත විය. ව්‍යාපෘතිය මගින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය පිලිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | රුපියල් මිලියන 14,383 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 110 ක් වෙන්කර ඇති අතර, 2019 දෙසැම්බර් 31 දින වනවිට භාවිතා කර ඇත්තේ සියයට 72.10 ක් නියෝජනය කරමින් රුපියල් මිලියන 12.389 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 79.32 ක් පමණි. ඉතිරි මාස 8 ක කාලය තුල සියයට 27.89 ක් නියෝජනය කරමින් රුපියල් මිලියන 1,994.05 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 30.68 ක් ඉතිරිව තිබුණි. මේ සම්බන්ධයෙන්, ව්‍යාපෘතියේ කටයුතු කාර්යක්ෂම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ කාලසීමාව දීර්ඝ කිරීමට හා පිරිවැය වැඩිවීමට හැකිය. | ව්‍යාපෘතිය විගණකාධිපතිවරයා පෙන්වා දෙන ලද ඉහත ප්‍රකාශය සමඟ එකඟ වේ. කෙසේ වෙතත් මේවන විට ව්‍යාපෘතිය 2020 ජුනි 30 දින සිට මාස 6 ක කාලයක් ලබා දී ඇති අතර මේ වනවිට ව්‍යාපෘතිය අවසන් කළයුතු දිනය 2020 දෙසැම්බර් 31 වන අතර සියලු බිල්පත් පියවීම සඳහා තවත් මාස 4 ක කාලයක් ලබාගත හැකිය. එබැවින් මේ කාල සීමාව තුළ ඉතිරි මුදල කිසිඳු ගැටලුවකින් තොරව භාවිතා කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. | අමතර කාලය හා පිරිවැය වලක්වා ගැනීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | විගණනය සඳහා ලබා දී ඇති තොරතුරු වලට අනුව 2019 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රදානය කරන ලද රුපියල් මිලියන 12,821.7 ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ 516 | ව්‍යාපෘතියේ කාලසීමාව දීර්ඝ කිරීමට හා පිරිවැය වැඩිවීමට හැකිය. | කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් මෙම පැකේජයන් නතර කරන ලදී. අදාළ සමාගම්වල මූල්‍ය ගැටලු හේතුවෙන් | අමතර කාලය හා පිරිවැය වලක්වා ගැනීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| කින් රුපියල් මිලියන 1,540.7 ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ 30 ක් කොන්ත්‍රාත් කාලය තුළ සම්පූර්ණකර නොතිබූ අතර ප්‍රමාද කාලය මාස 1 සිට 34 දක්වා විය. ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව වන්නේ කොන්ත්‍රාත් පරිපාලනය දූර්වල වීම සහ කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත් පියවීම ප්‍රමාද වීමයි. තවද කොන්ත්‍රාත්කරුවන්ගේ දූර්වල ක්‍රියාකාරීත්වය කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාව පිළිබඳ ගැටලු හේතුවෙන් රුපියල් මිලියන 759.9 ක් වටිනාකමැති කොන්ත්‍රාත් පැකේජ 32 නතර කර තිබුණි. | සමහර කොන්ත්‍රාත් අවසන් කරන ලදි. අවලංගු කරන ලද කොන්ත්‍රාත් වල ඉතිරි වැඩ ප්‍රමාණය පරිස්සමින් තක්සේරු කර, අපේක්ෂිත විෂය පථය සාක්ෂාත් කර ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමයක් භාවිතා කර නැවත ප්‍රදානය කිරීම සිදුකරමි. |

## 2.2 ඌණ උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| ව්‍යාපෘති කාලය වර්ෂයකට වඩා අඩුවෙන් තිබියදී පරිගණක උපාංග ගෘහ භාණ්ඩ හා සවිකිරීම් සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා ව්‍යාපෘති කාර්යාලය රුපියල් මිලියන 14.09 ක් වියදම් කර තිබුණි. | ව්‍යාපෘතියේ වියදම වැඩිවිය හැකිය. | 2019 වර්ෂයේදී ව්‍යාපෘතිය මඟින් රු.14,083,462 ක් වටිනා ස්ථාවර වත්කම් (පරිගණක උපාංග, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් සහ කාර්යාල උපකරණ) මිලදීගෙන තිබුණි. නමුත් අදාළ ලියකියවිලි කටයුතු කඩිනම් කිරීම සඳහා CBRC සංරචකය යටතේ ගාල්ල, හම්බන්තොට, කළුතර හා රත්නපුර යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ඉන් රු.2,086,864 ක් වටිනා වත්කම් මිලදී ගන්නා ලදි. පවත්නා CRIP ව්‍යාපෘතියේ අනුබණ්ඩ ව්‍යාපෘතියක් වන යෝජිත වන ව්‍යාපෘතිය CERS | ව්‍යාපෘතිය යටතේ ඇති වත්කම් උපයෝජනය කිරීමට අර්ථවත් පියවර ගත යුතුය. |

– MPA සකස් කර සැලසුම් කර ඇති අතර එය 2019 නොවැම්බර් වන විට ආරම්භ කිරීමට නියමිතව තිබුණි. 2019 වර්ෂයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහනට අනුව CERS – MPA ව්‍යාපෘතියේ සූදානම් කිරීමේ කටයුතු සඳහා CRIP අරමුදල භාවිතා කිරීමට අනුමැතිය ලැබී ඇත. ඒ අනුව CRIP අරමුදල යටතේ CERS – MPA ව්‍යාපෘතිය පරිඝනක හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට තීරණය කර ඇත. නමුත් පවතින නොවැලැක්විය හැකි තත්ත්වයන් හේතුවෙන් නව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වෙමින් පවතින අතර අවශ්‍යතාවය හඳුනාගෙන IAS හි ඉල්ලීම්වලින් පසුව ඌව (UVA) PRPD වෙත රු.1,230,000 ක වත්කම් ID වෙත රු 410,000 ක වත්කම් සහ ආයෝජන ද්‍රෝණි සැලැස්මට රු.1,962,127 ක්වූ වත්කම් ද බෙදාහැර ඇති අතර ඉතිරි රු.8,396,380 ක්වූ වත්කම් දැනට CRIP PMN වල හා CRES – MPA කාර්යාලවල කටයුතු සඳහා භාවිතයට ගෙන ඇත. CRIP ව්‍යාපෘතිය අවසන් කළ යුතු දිනය 2020 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර ඇති අතර පවත්නා ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසුව අනාගතයේදී සියලුම වත්කම් යෝජිත නව ව්‍යාපෘතිය වන CRES – MPA හි භාවිතයට යොදාගනී.